## ශ්‍රී ලංකා සිතියමේ ස්ථාන

| වර්ෂය | ගංගා | වැව්, අමුණු හා ජලාශ | වරායන් | ඓතිහාසික හා පූජනීය | යුරෝපීය සමය | ප්‍රාග්, පූර්ව | රාජධානි |
|---|---|---|---|---|---|---|---|
| 2016 | දැදුරු ඔය | යෝධ වැව | ලංකා පුටන | නල්ලූර් | හලාවත | බුන්දල | සෙංකඩගල |
| | ගල් ඔය | කලා වැව | ඌරාතොට | කතරගම | | ඉබ්බන්කටුව | |
| 2017 | කිරිඳි ඔය | ඉරණමඩු වැව | දේවනගර් | කන්තරෝදය | සාල්වතොට | පොම්පරිප්පු | ශ්‍රී ජයවර්ධනපුර |
| | කලා ඔය | සොරබොර වැව | සාල්වතොට | | ගාලු වරාය | | කොට්ටේ |
| | | | ගාලු වරාය | | | | |
| 2018 | ගල් ඔය | පදවිය වැව | දඹකොළපටුන | තිරුකේශ්වරම් | මීගමුව | මිනිහාගල්කන්ද | ගම්පොළ |
| | යාන් ඔය | මිණිපේ අමුණ | ඌරාතොට | | | | |
| | | | කාලතිත්ථ | | | | |
| 2019 | දැදුරු ඔය | ගල් ඔය | මහාතිත්ථ | කෝණේශ්වරම් | කොළඹ | | පඬුවස්නුවර |
| | කුඹුක්කන් ඔය | පරාක්‍රම සමුද්‍රය | ගොඩවාය | | | | |
| | | පොල්ගොල්ල වේල්ල | | | | | |
| 2020 | මාදුරු ඔය | ඉරණමඩු වැව | ලංකාපටුන | නල්ලූර් | මන්නාරම | හෝර්ටන්තැන්න | සෙංකඩගල |
| | | කොත්මලේ | | මිහින්තලේ | දූපත | | කුරුණෑගල |
| | | ජලාශය | | කාවරගාම | | | |
| 2021/22 | මැණික් ගඟ | සොරබොර වැව | කාලතිත්ථ | කන්තරෝඩය | ගන්නෝරුව | | පොළොන්නරුව |
| | කලා ඔය | නාච්චිදූව වැව | ගෝකණ්ණ | | හලාවත | | කෝට්ටේ |
| | | | දෙවුන්දර | | | | |
| 2022/23 | යාන් ඔය | කලා වැව | දඹකොළපුටුන | | ගාලුවරාය | ඉරණමඩු | මාගම |
| | ගල් ඔය | යෝධ වැව | ගාලුවරාය | | මඩකලපුව මීගමුව | | අනුරාධපුරය |
| 2023/24 | කිරිඳි ඔය | පරාක්‍රම සමුද්‍රය | සූකරතිත්ථ | දීඝවාපිය | මාතර | පොම්පරිප්පු | |
| | කැලණි ගඟ | තිසා වැව | | | පෙඩ්රික් | | |
| | | මිණිපේ අමුණ | | | කොටුව | | |
| | | වික්ටෝරියා ජලාශය | | | එළිපන්ට්ෆාස් | | |

## ලෝක සිතියමේ ස්ථාන

| වර්ෂය | රටවල් හා දූපත් රාජ්‍ය | නගර | ඉන්දියා | මුහුදු | මුහුදු ආශ්‍රිත පිහිටීම් |
|---|---|---|---|---|---|
| 2016 | ඉතාලිය | කොන්ස්තන්තිනෝපල් | මදුරාසිය / කැලිකට් | | පර්සියන් බොක්ක |
| | ජාවා දූපත | | | | |
| 2017 | ජපානය | රෝමය | බොම්බාය | රතු මුහුද | |
| | පෘතුගාලය | | | | |
| | මලය අර්ධද්වීපය | | | | |
| 2018 | බුරුමය | වතිකානුව | කැලිකට් | | සූවස් ඇළ |
| | | බතාවියා | | | |
| | | හිරෝෂිමා | | | |
| 2019 | ඉතාලියා | ලිස්බන් | කල්කටා | | පර්සියන් බොක්ක |
| | සුමාත්‍රා දූපත් | | | | මලක්කා සමුද්‍ර සන්ධිය |

| වර්ෂය | රටවල් හා දූපත් රාජ්‍ය | නගර | ඉන්දියා | මුහුදු | මුහුදු ආශ්‍රිත පිහිටීම් |
|---|---|---|---|---|---|
| 2020 | ජාවා දූපත | වැනීසිය | ගෝව | මධ්‍යධරණී මුහුද | |
| | කොරියානු අර්ධද්වීපය | | මදුරාසිය | | |
| | | | | | |
| 2021/22 | තායිවානය | ලන්ඩන් | | රතු මුහුද | බෙංගාල බොක්ක |
| | රෝමය | | | | |
| | පෘතුගාලය | | | | |
| 2022/23 | ප්‍රංශය | කොන්ස්තන්තිනෝපල් | බොම්බාය | අරාබි මුහුද | සූවස් ඇළ |
| | ජපන් දූපත් | | | | |
| 2023/24 | මහා බ්‍රිතාන්‍ය | ටෝකියෝ | කල්කටා | කළු මුහුද | |
| | ජාවා දූපත | | | | |
| | ඉතාලිය | | | | |
| | | | | | |

## ඡායාරූප

### 2016

- *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. '*A*' වලින් දැක්වෙන නිර්මාණය හඳුන්වන නම කුමක් ද?
2. මෙය සොයා ගන්නා ලද්දේ කවර ස්තූපයක කරන ලද කැණීමකින් ද?
3. මෙම නිර්මාණය නිර්මිත ලෝහය කුමක් ද?
4. මෙම පුරාවස්තුව සොයා ගත් ස්ථානයේ දී උපත ලැබුවේ යැයි සැලකෙන රජතුමාගේ නම කුමක් ද?

(ලකුණු 04 යි)



*A*

(iii) 1. '*B*' වලින් දැක්වෙන නිර්මාණයේ නම කුමක් ද?
2. මෙය කිනම් ආගමකට අයත් ද?
3. මෙය පිහිටා ඇත්තේ ශ්‍රී ලංකාවේ කවර ඓතිහාසික නගරයක ද?
4. මෙය ගොඩනඟන ලද්දේ ශ්‍රී ලංකාව යටත් කර ගත් කවර විදේශීය පාලකයන් විසින් ද?

(ලකුණු 04 යි)



*B*

## 2017

● *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. '*A*' වලින් දැක්වෙන නිර්මාණය කුමක් ද?

2. එයින් කෙරෙන කාර්යය කුමක් ද?

3. මේවා කවර වාරි නිර්මාණයක් ආශ්‍රිතව දැකිය හැකි වේ ද?

4. මේවා නිර්මාණය කිරීමට යොදාගත් ද්‍රව්‍යයක් සඳහන් කරන්න.

(ලකුණු 04 යි)



*A*


(iii) 1. '*B*' වලින් දැක්වෙන්නේ කුමක් ද?

2. එය පිහිටා ඇති නගරය කුමක් ද?

3. මෙය භාවිත කර ඇත්තේ කවුරුන් රැඳවීම සඳහා ද?

4. ලෝකයේ කවර විප්ලවයක් හා මෙය සම්බන්ධ ද?

(ලකුණු 04 යි)



*B*

## 2018

● *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. '*A*' අක්ෂරයෙන් දක්වා ඇති මූර්තිය හඳුන්වන නම කුමක් ද?

2. එය දක්නට ලැබෙන පූජනීය ස්ථානය කුමක් ද?

3. මෙයින් නිරූපිත පුද්ගලයා කවරෙකු ලෙස හඳුනාගෙන තිබේ ද?

4. මෙම කලා කෘතිය ශ්‍රී ලංකාවේ කුමන රාජධානි යුගයකට අයත් ද?

(ලකුණු 04 යි)



*A*

(iii) 1. '*B*' වලින් දැක්වෙන චිත්‍රයේ නිරූපිත පුද්ගලයාගේ නම දක්වන්න.

2. මෙතුමා ශ්‍රී ලංකාවේ කවර රාජධානියක පාලකයා වී ද?

3. රාජ්‍යත්වයට පත්වීමට පෙරදී මෙතුමා හැඳින්වූයේ කවර නමකින් ද?

4. මෙම චිත්‍රය අඳින ලදැයි සැලකෙන පුද්ගලයා නම් කරන්න.

(ලකුණු 04 යි)



*B*

## 2019

● *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. *A* වලින් දැක්වෙන ශිලාලිපිය හඳුන්වන නම කුමක් ද?
2. එය කරවන ලද රජතුමාගේ නම කුමක් ද?
3. එම රජතුමා අයත් වූ රාජවංශය නම් කරන්න.
4. මෙම ශිලාලිපිය පිහිටුවා ඇති ඓතිහාසික නගරය සඳහන් කරන්න.

(ලකුණු 04 යි)



*A*



*B*

(iii) 1. *B* වලින් දැක්වෙන පුද්ගලයාගේ නම කුමක් ද?
2. දෙවන ලෝක මහා සංග්‍රාම සමයේ දී මොහු කුමන රටක පාලකයා වී ද?
3. මොහුගේ දේශපාලන දර්ශනය හඳුන්වන නම කුමක් ද?
4. සතුරන් මර්දනය කිරීම සඳහා මොහු විසින් පිහිටුවා ගත් රහස් පොලිසිය හැඳින් වූ නම දක්වන්න.

(ලකුණු 04 යි)

## 2020

● *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. *A* රූපයෙන් දැක්වෙන චිත්‍රය සිතුවම් කොට ඇත්තේ කොහේ ද?
2. එය කරවූවා යැයි සැලකෙන රජතුමා නම් කරන්න.
3. රූපයේ දැක්වෙන කාන්තාවන් පැළඳ සිටින ආභරණ අතුරෙන් එකක් සඳහන් කරන්න.
4. මෙම චිත්‍රය නැරඹූ අය තම අදහස් සටහන් කොට ඇති නිර්මාණය නම් කරන්න.

(ලකුණු 04 යි)



*A*

(iii) 1. *B* රූපයෙන් දැක්වෙන පුද්ගලයාගේ නම කුමක් ද?
2. දෙවන ලෝක මහා යුද සමයේ මොහු කුමන රටක රාජ්‍ය නායකයා වී ද?
3. මොහුගේ දේශපාලන දර්ශනය හඳුන්වනු ලැබූයේ කුමන නමකින් ද?
4. මොහු විසින් යුද බලයෙන් යටත් කරගත් අප්‍රිකානු රට නම් කරන්න.

(ලකුණු 04 යි)



*B*

## 2021-2022

- *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. *A* රූපයෙන් දැක්වෙන රජතුමාගේ නම සඳහන් කරන්න.
2. රජවීමට පෙර මෙතුමා හැඳින් වූ නම කුමක් ද?
3. මෙම රජතුමා අයත් වූ රාජවංශය කුමක් ද?
4. මෙතුමා විසින් දළදා මාළිගා සංකීර්ණයට එක් කරන ලද කලාත්මක නිර්මාණය සඳහන් කරන්න.

(ලකුණු 04 යි)



*A*

(iii) 1. *B* රූපයෙන් දැක්වෙන චිත්‍රයේ නිරූපණය වන්නේ කවුරුන් ද?
2. මෙය සිතුවම් කොට ඇති දේවස්ථානය නම් කරන්න.
3. මෙම චිත්‍රය සිතුවම් කළ චිත්‍ර ශිල්පියා සඳහන් කරන්න.
4. මෙම චිත්‍රය කිනම් යුගයකට අයත් වේ ද?

(ලකුණු 04 යි)



*B*

## 2022-2023

- *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. *A* රූපයෙන් නිරූපණය වන්නේ කුමක් ද?
2. එය භාවිත කළේ කුමක් සඳහා ද?
3. මෙම නිර්මාණයට අයත් නටබුන් සොයාගත් ප්‍රදේශය කුමක් ද?
4. එය ක්‍රියාකරවීම සඳහා යොදාගත් ස්වභාවික බලශක්තිය කුමක් ද?


(ලකුණු 04 යි)



*A*

(iii) 1. *B* රූපයෙන් නිරූපණය වන්නේ කුමක් ද?
2. එය නිර්මාණය කළේ කවුද?
3. මෙය භාවිත කළ කර්මාන්තය කුමක් ද?
4. එය භාවිත කරන ලද්දේ කුමන කරුණක් සඳහා ද?

(ලකුණු 04 යි)




*B*

## 2023-2024

● *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. *A* රූපයෙන් දැක්වෙන චිත්‍රයේ දක්නට ලැබෙන උපකරණය කුමක් ද?
2. එය භාවිත කරන ලද්දේ කුමන කාර්යයක් සඳහා ද?
3. එය නිර්මාණය කරන ලද පුද්ගලයා කවුද?
4. ඔහු කුමන ජාතිකයෙක් ද?



*A*

(iii) 1. *B* රූපයෙන් දැක්වෙන පුද්ගලයාගේ නම කුමක් ද?
2. එතුමා ශ්‍රී ලංකාවට පැමිණීමට හේතු වූ, ජාත්‍යන්තර ප්‍රසිද්ධියක් ලැබුණු වාදය කුමක් ද?
3. මෙතුමාගේ මග පෙන්වීම යටතේ පිහිටුවා ගන්නා ලද සංවිධානය කුමක් ද?
4. මෙතුමාගේ මූලිකත්වයෙන් මෙරට ආරම්භ කරන ලද පාසලක නම ලියන්න.

(ලකුණු 04 යි)



*B*

# කෙටි ප්‍රශ්න

## 2016

**(ආ)** (i) පහත *A*, *B*, *C* හා *D* යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන් දැයි අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - ඉන්දියාවට ගොඩ බැස තමන් ක්‍රිස්තියානින් සහ කුළුබඩු සොයා පැමිණි බව ප්‍රකාශ කළ නැනැත්තා
*B* - 'තිලෝක සුන්දරී' නමැති කාලිංග කුමරිය විවාහ කර ගත් පොළොන්නරු පාලකයා
*C* - මෙරට පාලනය කළ පළමු ලම්බකර්ණ රජතුමා
*D* - දෙවන ලෝක මහා සංග්‍රාමයට සම්බන්ධ වූ ඉතාලි ෆැසිස්ට් පාලකයා (ලකුණු 04 යි)

## 2017

**(ආ)** (i) පහත *A*, *B*, *C* හා *D* යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - යුරෝපීය ජාතීන්ගේ ආගමනයට පෙර ඉන්දියන් සාගරයේ වෙළෙඳ ඒකාධිකාරය හිමි කර ගත් ජාතිය
*B* - පෘතුගීසින් මෙරටින් නෙරපීමට නාවුක බලයක් ඇති විදේශීය ජාතියක සහාය ලබා ගත් උඩරට රජතුමා
*C* - ගල්පොත ශිලාලිපිය කරවූ පොළොන්නරු පාලකයා
*D* - දෙවන ලෝක මහා සංග්‍රාම සමයේදී පළමු න්‍යෂ්ටික බෝම්බ ප්‍රහාරයට ලක්වූ නගරය (ලකුණු 04 යි)

## 2018

**(ආ)** (i) පහත *A*, *B*, *C* හා *D* යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාළ පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - පළමුවන විජයබාහු රජුගේ කුලී හමුදාව හැඳින්වූ නම

*B* - ක්‍රි.ව. 1498 දී ඉන්දියාවට පැමිණි පෘතුගීසි නාවිකයා

*C* - දෙවන ලෝක මහා සංග්‍රාම අවධියේ මිත්‍ර පක්ෂයට නායකත්වය දුන් බ්‍රිතාන්‍ය අගමැතිවරයා

*D* - දෙවන ලෝක මහා සංග්‍රාම අවධියේ ජපානය පාලනය කළ අධිරාජයා (ලකුණු 04 යි)

## 2019

**(ආ)** (i) පහත *A*, *B*, *C* හා *D* යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාළ පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - අනුරාධපුර රාජධානියේ අවසන් පාලකයා

*B* - සීතාවක මායාදුන්නේ රජුට නාවුක ආධාර සැපයූ කැලිකට් හි පාලකයා

*C* - අතීතයේ වෙළෙඳ මධ්‍යස්ථානයක් වූ කොන්ස්තන්තිනෝපල් නගරය වර්තමානයේ හඳුන්වන නම

*D* - සුවස් ඇළ ජනසතු කළ මිසර ජනාධිපතිවරයා (ලකුණු 04 යි)

## 2020

(ආ) (i) පහත *A*, *B*, *C* හා *D* යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - දේශ ගවේෂණ කටයුතුවලට අනුග්‍රහය දැක්වූ පෘතුගාලයේ රාජකීය පුද්ගලයා නම් කරන්න.

*B* - දෙවන ලෝක මහා යුද්ධය අවසන් කිරීමේ ගිවිසුමට අත්සන් කළ ජපාන අධිරාජයා නම් කරන්න.

*C* - පළමුවන විජයබාහු රජතුමා පිළිබඳ තොරතුරු ලැබෙන තඹ සන්නස කුමක් ද?

*D* - ශ්‍රී ලංකාවේ 'නිදහස් අධ්‍යාපනයේ පියා' වශයෙන් ගෞරවයට පාත්‍ර වූ ඇමතිවරයා නම් කරන්න. (

## 2021 - 2022

**(ආ)** (i) පහත *A*, *B*, *C* හා *D* යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධි නාමය ලැබූ රජතුමා සඳහන් කරන්න.

*B* - ශ්‍රී ලංකාවේ බෞද්ධ පාසල් පිහිටුවීම සඳහා පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ විදේශීය ජාතිකයා කවුරුන් ද?

*C* - පළමුවන ලෝක මහා සංග්‍රාමයෙන් පසු පරාජිත ජර්මනිය සමග අත්සන් කරන ලද ගිවිසුම කුමක් ද?

*D* - නොබැඳි ජාතීන්ගේ සංවිධානය පිහිටුවීමට මුල් වූ ඉන්දීය අගමැතිවරයා නම් කරන්න. (ලකුණු 04 යි)

## 2022 - 2023

(ආ) (i) පහත $A, B, C$ හා $D$ යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - ශ්‍රී ලංකාව ජනාවාස කළ මුල් ම මානවයා හඳුන්වන නම කුමක් ද?

*B* - "අහසින් වැටෙන එක දිය බිඳක්වත් ප්‍රයෝජනයට නොගෙන මුහුදට යාමට ඉඩ නොදිය යුතු ය." යන ප්‍රකාශය කළ පාලකයා කවුරුන් ද?

*C* - මොනාලිසා චිත්‍රය සිතුවම් කළ ශිල්පියාගේ නම සඳහන් කරන්න.

*D* - ගුවන් විදුලි තරංග මගින් පණිවුඩ යැවීමේ ක්‍රමය සොයාගත් තැනැත්තා කවුරුන් ද?

## 2023 - 2024

(ආ) (i) පහත $A, B, C$ හා $D$ යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - ශ්‍රී ලංකාව ද ඇතුළත් කොට ලෝක සිතියමක් නිර්මාණය කළ පුරාණ ග්‍රීක ජාතික භූගෝල විද්‍යාඥයා කවුරුන් ද?

*B* - ගල්පොත ශිලා ලිපිය කරවූ රජතුමාගේ නම සඳහන් කරන්න.

*C* - දුරකථනය නිපදවූ ඇමෙරිකානු ජාතිකයා කවුද?

*D* - නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැතිවරයාගේ නම ලියන්න.

# 01. ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රය

## ප්‍රශ්න පැමිණීම - 2019 / 2020 / 2023-24

### 2019

2\. (i) ශිලාලිපි නිර්මාණය කර ඇති ස්වරූපය අනුව වර්ග කළ හැකි ආකාර **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(ii) පහත *A* සිට *D* දක්වා දී ඇති එක් එක් ප්‍රකාශයට අදාළ පිළිතුර වරහන් තුළින් තෝරා **අනුපිළිවෙළින්** ලියා දක්වන්න.

*A* - ශ්‍රී ලංකාවේ සිතියමක් අඳින ලද මුල්ම ග්‍රීක ජාතිකයා

*B* - අනුරාධපුර මුල් යුගයේ ශිලාලිපිවල භාවිත වූ අක්ෂරමාලාව හඳුන්වන නම

*C* - පුරාවිද්‍යාත්මක කැනීම්වලින් ශ්‍රී ලංකාවේ හමු වූ පැරණිතම කාසි හඳුන්වන නම

*D* - වසභ රාජ්‍ය සමයේ දී සෑෂිගිරි (ඉසගිරි) ඇමතිවරයා විසින් නකදිව පාලනය කළ බව සඳහන් මූලාශ්‍රය

(මෙගස්තිනිස්, බ්‍රාහ්මී, සංස්කෘත, ටොලමි, කහාපණ, වල්ලිපුරම් රන් සන්නස, රිදී මස්ස, පනාකඩුව තඹ සන්නස) (ලකුණු 04 යි)

(iii) ඉතිහාසය ගොඩ නැගීමේ දී ශිලාලිපි වැදගත්වන ආකාරය කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) ඉතිහාසය ඉගෙනීමෙන් ලද හැකි ප්‍රයෝජන **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

### 2020

2\. (i) අතීතයේ දී ශ්‍රී ලංකාවේ කාසි නිර්මාණය සඳහා යොදාගත් ලෝහ වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පුරාවිද්‍යාත්මක කැනීම්වලින් මෙරටින් හමු වූ විදේශ කාසි අයත් වූ රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) විදේශ වෙළෙඳ සම්බන්ධතා පැවැත්වීමට යොදාගත් ශ්‍රී ලංකාවේ පැරණි වරායන් දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

(iv) ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රයක් වශයෙන් කාසි වැදගත් වන ආකාරය කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(v) පුරාවස්තු රැකගැනීමේ වැදගත්කම කරුණු තුනක් යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

### 2023-2024

2\. (i) ශ්‍රී ලංකාවට පැමිණ මෙරට පිළිබඳ තොරතුරු වාර්තා කළ විදේශිකයින් **තිදෙනෙකුගේ** නම් ලියන්න. (ලකුණු 03 යි)

(ii) ඉතිහාසය ගොඩනැගීම සඳහා සාහිත්‍ය මූලාශ්‍රය භාවිත කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) පුරාවස්තු විනාශ වීමට බලපාන මානව ක්‍රියාකාරකම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

# 02. ශ්‍රී ලංකාව ජනාවාස වීම

## ප්‍රශ්න පැමිණීම - 2016 සිට 2024 දක්වා සෑම වර්ෂයකම

### 2016

2. (i) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් මානවයා ජීවත්වූ පරිසර කලාප **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූයේ යැයි සැලකෙන වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන පැවති ස්ථාන **දෙකක්** සහ ගල් ගුහා වාසස්ථාන පැවති ස්ථාන **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) ප්‍රාග් ඓතිහාසික යුගයේ විසූ මානවයාගේ ආහාර රටාව ඔවුන් ජීවත් වූ විවිධ පරිසරයන්ට අනුව හැඩ ගැසී තිබූ ආකාරය නිදසුන් **දෙකක්** දක්වමින් පෙන්වා දෙන්න. (ලකුණු 05 යි)

(iv) පූර්ව ඓතිහාසික යුගයේ ජීවත්වූවකු මිය ගිය විට අනුගමනය කරන්නට ඇතැයි සැලකෙන අවමංගල්‍ය චාරිත්‍ර විධි මොනවා දැයි කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

### 2017

2. (i) ශ්‍රී ලංකාවේ දකුණු පළාතට අයත්වන අර්ධ ශුෂ්ක කලාපයේ ප්‍රාග් ඓතිහාසික ගල් මෙවලම් හමු වී ඇති ස්ථාන **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන රටාවේ කැපී පෙනුණු ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) (a) පූර්ව ඓතිහාසික යුගය යනුවෙන් සැලකෙනුයේ කවර කාල පරිච්ඡේදයක් ද?
(b) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් සුසාන භූමි පිහිටි ස්ථාන **තුනක්** දක්වන්න. (ලකුණු 05 යි)

(iv) පූර්ව ඓතිහාසික යුගයේ ජීවත්වූ මානවයා තාක්ෂණය භාවිත කළ ආකාරය කරුණු **තුනක්** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

### 2018

2. (i) *A* - ශ්‍රී ලංකාව ජනාවාස කළ මුල් ම මානවයා හඳුන්වන නම ද
*B* - ඔවුන් ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වූ පරිසර කලාප **දෙකක්** ද දක්වන්න. (ලකුණු 03 යි)

(ii) පූර්ව ඓතිහාසික යුගය පරිවර්තන යුගයක් ලෙස සැලකීමට හේතු වූ සාධක **දෙකක්** දක්වන්න. (ලකුණු 04 යි)

(iii) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ස්වරූපය කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) ඓතිහාසික යුගයේ පැවති ආර්ථික රටාව තුළ කෘෂිකර්මාන්තය සංවිධානය වී තිබූ ආකාරය නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

### 2019

3. (i) ප්‍රාග් ඓතිහාසික මානවයන් මෙවලම් තැනීම සඳහා භාවිත කළ පාෂාණ වර්ග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) *A* - ප්‍රාග් ඓතිහාසික මානවයන් ජීවත් වූ පහතරට තෙත් කලාපීය ලෙන් **දෙකක්** ද,
*B* - ඔවුන් දඩයම් කළ සත්ව වර්ග **දෙකක්** ද **පිළිවෙළින්** ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ මානව ජීවිතයේ ඇති වූ වෙනස්කම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) මුල් ඓතිහාසික යුගයේ දී ජනාවාස ව්‍යාප්ති රටාවේ වර්ධනය වූ ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## 2020

3. (i) මෙරට අධික වර්ෂාපතනයක් පැවති භූ අවධිය කුමක් ද? (ලකුණු 01 යි)
(ii) ප්‍රාග් ඓතිහාසික මානවයන් පිළිබඳ තොරතුරු ලැබෙන හම්බන්තොට දිස්ත්‍රික්කයේ ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)
(iii) (a) ප්‍රාග් ඓතිහාසික මානවයන් ආහාර සපයාගත් ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(b) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා ආහාරයට ගත් ශාකමය ආහාර වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)
(iv) පූර්ව ඓතිහාසික යුගයේ මානවයා භාවිත කළ තාක්ෂණික දැනුම, උඩරංචාමඩම ආශ්‍රිත කැනීම්වලින් අනාවරණය කරගත් තොරතුරු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)
(v) වසභ රජතුමාගේ පාලන කාලයේ දී මහ වැව් ඉදිකිරීම ආරම්භ වීමට පසුබිම් වූ හේතු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## 2021 - 2022

2. (i) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ පරිසර කලාප **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)
(ii) ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන රටාවේ දක්නට ලැබුණු ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(iii) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය, ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන් කර හඳුනාගත හැකි කරුණු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)
(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ව්‍යුහය හා ස්වරූපය කරුණු **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

## 2022 - 2023

2. (i) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ එළිමහන් වාසස්ථාන **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)
(ii) ප්‍රාග් ඓතිහාසික මානවයා සිය වාසස්ථාන තෝරාගැනීමේ දී අවධානය යොමු කරන ලද කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)
(iii) පූර්ව ඓතිහාසික යුගයේ මානවයා භාවිත කළ තාක්ෂණය කරුණු **දෙකක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05 යි)
(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## 2023 - 2024

3. (i) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා වාසය කළ ගල්ලෙන් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(ii) පූර්ව ඓතිහාසික යුගයේ සුසාන භූමි හමු වූ ස්ථාන **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(iii) පූර්ව ඓතිහාසික යුගයේ මානවයාගේ ජීවන රටාවේ ලක්ෂණ **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)
(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස, පූර්ව ඓතිහාසික යුගයෙන් වෙනස්වන ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

# 03. ශ්‍රී ලංකාවේ දේශපාලන බලය විකාශනය වීම

## ප්‍රශ්න පැමිණීම - 2016 / 2017 / 2021-22

### 2016

3. (i) මෙරට ශිලා ලිපිවල සඳහන් තොරතුරුවලට අනුව පහත A, B හා C වලින් දැක්වෙන එක් එක් පුද්ගලයන්ගේ තනතුරු නාම අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - පවුලක ප්‍රධානියා
B - ගමක ප්‍රධානියා
C - ගම් කිහිපයක හෝ වැව් පද්ධතියක ප්‍රධානියා (ලකුණු 03 යි)

(ii) මධ්‍යම පාලනයට සම්බන්ධ පහත සඳහන් කාර්ය භාර වූ තැනැත්තන්ගේ නිල නාම මොනවා දැයි වරහන් තුළින් තෝරා A, B, C හා D අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - ඇමති මණ්ඩලයේ ප්‍රධානියා ලෙස කටයුතු කිරීම
B - රාජ්‍ය භාණ්ඩාගාරය සම්බන්ධව කටයුතු කිරීම
C - නගරයේ පාලනය සම්බන්ධව කටයුතු කිරීම
D - රජුගේ ඇතුන් සම්බන්ධව කටයුතු කිරීම

(වෙදනා, මහමත, බඩගරික, ශෙනපති, හති අදෙක, නගරගුතික, අස අදෙක, බතගු) (ලකුණු 04 යි)

(iii) රටේ ජනතාව රජතුමාගෙන් අපේක්ෂා කළ සේවා **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) වසභ රජතුමා මෙරට බිහි වූ ශ්‍රේෂ්ඨ පාලකයකු බව කරුණු **තුනක්** ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)

### 2017

3. (i) ශ්‍රී ලංකාවේ මධ්‍යගත පාලනයට අයත් වූ පහත සඳහන් කාර්යයන් හා සම්බන්ධ පුද්ගලයන්ගේ නිල නාම වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් දක්වන්න.

A - කාසි අච්චු ගැසීමේ අංශ ප්‍රධානියා
B - අශ්ව අංශයේ ප්‍රධානියා
C - වෙළෙඳ කටයුතු පිළිබඳ ප්‍රධානියා

(රූප අදෙක, පන අදෙක, නගර වුඩික, නට අදෙක, අස අදෙක) (ලකුණු 03 යි)

(ii) පහත සඳහන් එක් එක් කරුණට සම්බන්ධ පාලකයන් කවුරුන්දැයි අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - තම මාමාවරුන් යටත් කොට රජකමට පත් වීම
B - මෙරට ඉතිහාසයේ ප්‍රථම වරට සංවිධානාත්මක සටන් ව්‍යාපාරයක් දියත් කොට එක්සත් ලංකාවක් බිහි කිරීම
C - විශාල වැව් ඉදිකිරීමේ ප්‍රමුඛයා වීම
D - පාණ්ඩ්‍ය වංශිකයන්ගේ ආධාරයෙන් පොළොන්නරුවේ තෙවරක් බලයට පත්වූ රැජින වීම (ලකුණු 04 යි)

(iii) අතීත ශ්‍රී ලංකාවේ ගමක පාලනය සිදුවූ ආකාරය එහි නායකත්වය හා කාර්යභාරය ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

### 2021 - 2022

3. (i) අතීත ශ්‍රී ලංකාවේ පහත දැක්වෙන පුද්ගලයන් හැඳින්වූ තනතුරු නාම **අනුපිළිවෙළින්** ලියා දක්වන්න.

A - පවුලක ප්‍රධානියා
B - ගමක නායකයා
C - කුඩා ප්‍රදේශයක් පාලනය කළ කාන්තාව (ලකුණු 03 යි)

(ii) පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් හා සම්බන්ධ රජවරුන් **අනුපිළිවෙළින්** සඳහන් කරන්න.

A - අනුරාධපුරය සැලසුම්ගත නගරයක් බවට පත් කිරීම
B - ශ්‍රී මහා බෝධි රෝපණය
C - මින්නේරිය වැව ඉදිකිරීම
D - පොළොන්නරුව චෝළ පාලනයෙන් මුදාගැනීම (ලකුණු 04 යි)

(iii) වසභ රාජ්‍ය සමයේ වැදගත්කම කරුණු **දෙකක්** යටතේ විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) අනුරාධපුර හා පොළොන්නරු රාජධානිවල රජවරුන් විදේශ රටවල් සමග පැවැත්වූ සබඳතා නිදසුන් **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

## 04. ශ්‍රී ලංකාවේ පැරණි සමාජය

### ප්‍රශ්න පැමිණීම - 2017 / 2022-23

#### 2017

3\. (iv) අතීත ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි දේශීය මෙන් ම විදේශීය වෙළෙඳාමට ප්‍රධාන තැනක් හිමිව තිබූ බව කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

#### 2022 - 2023

3\. (i) පැරණි සමාජයේ වී වගා කළ කන්න **තුන** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) අතීතයේ හේන්වල වගාකරන ලද බෝග වර්ග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) පැරණි කාලයේ මෙරට විවිධ කර්මාන්ත පැවති බව කරුණු **දෙකක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) අතීතයේ මෙරට විධිමත් අභ්‍යන්තර වෙළෙඳාමක් පැවති ආකාරය කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## 05. ශ්‍රී ලංකාවේ පැරණි විද්‍යාව හා තාක්ෂණය

### ප්‍රශ්න පැමිණීම - 2016 / 2017 / 2018 / 2019 / 2020

#### 2016

4\. (i) ඇළහැර ඇළ මගින් ජලය සපයනු ලබන වැව් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත *A* සිට *D* දක්වා දී ඇති එක් එක් ප්‍රකාශයට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ලියා දක්වන්න.

*A* - මහියංගනයට දකුණු දෙසින් මහවැලි ගඟ හරස්කොට තැනූ අමුණ

*B* - කලා වැවේ සිට තිසා වැව දක්වා ජලය ගෙනයාම සඳහා නිර්මාණය කළ ඇළ

*C* - "අහසින් වැටෙන එක දිය බිඳක්වත් ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යාමට ඉඩ නොදිය යුතු ය." යන අදහස දැරූ රජතුමා

*D* - වර්ෂා ජලයෙන් පෝෂණය වන කුඩා වැව් පද්ධතියක් හඳුන්වනු ලබන නම (ලකුණු 04 යි)

(iii) (a) වැවක ප්‍රධාන තාක්ෂණික අංග **දෙකක්** නම් කරන්න.

(b) ඔබ ඉහත (a) හි නම් කළ, එක් තාක්ෂණික අංගයක නිර්මාණය හා ප්‍රයෝජන පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) පොළොන්නරු රාජධානිය බිඳවැටීමෙන් පසුව මහා පරිමාණ වාරිමාර්ග ක්‍රම බිහි නොවූයේ ඇයි දැයි කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

#### 2017

4\. (i) අනුරාධපුර යුගයේ දී ඉදි කරන ලද විශාල වැව් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත *A*, *B*, *C* හා *D* වලින් දැක්වෙන පැරණි තාක්ෂණය හා සම්බන්ධ නිර්මාණ මොනවාදැයි වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් දක්වන්න.

*A* - ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයන් තම කාර්යයන් ඉටු කර ගැනීම සඳහා භාවිත කළ තාක්ෂණික උපකරණ හඳුන්වන නම

*B* - මැටි බඳුන් සැකසීම සඳහා යොදා ගත් තාක්ෂණික උපකරණය

*C* - ජල පීඩනය සමනය කොට ඇළට ජලය නිකුත් කිරීමට භාවිත කළ තාක්ෂණික නිර්මාණය

*D* - ස්ථිතික ජල විද්‍යා මූලධර්මය භාවිත කොට කරන ලද නිර්මාණය

(රළ පනාව, බිසෝ කොටුව, දුනු-ඊතල, සකපෝරුව, ශිලා මෙවලම්, ඇදිගම ඇත් පහන, පිටවාන, කටාරම) (ලකුණු 04 යි)

(iii) අතීත පාලකයන් මහවැව් ඉදි කිරීමෙන් බලාපොරොත්තු වූ අරමුණු **දෙකක්** සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) (a) අතීත ශ්‍රී ලංකාවේ දියුණු යකඩ නිස්සාරණ තාක්ෂණයක් තිබූ බවට පුරා විද්‍යාත්මක තොරතුරු ලැබෙන ස්ථාන **දෙකක්** සඳහන් කරන්න.

(b) එම ස්ථානයන්හි යකඩ නිස්සාරණය කළ ආකාරය සැකෙවින් දක්වන්න. (ලකුණු 06 යි)

## 2018

**3.** (i) *A* - අනුරාධපුරය
*B* - පොළොන්නරුව
*C* - මාගම යන අතීත පාලන මධ්‍යස්ථාන පිහිටා ඇත්තේ කවර ගංගා නිම්න ආශ්‍රිත ව දැයි වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් දක්වන්න.
(කලා ඔය, කිරිඳි ඔය, මහවැලි ගඟ, වලවේ ගඟ, මල්වතු ඔය, ගල් ඔය) (ලකුණු 03 යි)

(ii) *A* - අනුරාධපුර නගරයට ජලය සැපයීම සඳහා ඉදිකරන්නට ඇතැයි සැලකෙන වැව් **දෙකක්** ද,
*B* - භික්ෂූන් වහන්සේලා සඳහා ඉදි කළ පොකුණු **දෙකක්** ද නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) ඓතිහාසික යුගයේදී විශාල වාරි පද්ධති නිර්මාණය කිරීමේ අවශ්‍යතාවයක් ඇති වූයේ ඇයි දැයි සාධක **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) *A* - වැව් බැම්ම
*B* - සොරොව්ව
*C* - බිසෝකොටුව
*D* - පිටවාන යන වැවක දක්නට ඇති තාක්ෂණික අංග අතුරෙන් **දෙකක** නිර්මාණය හා කාර්යය පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 06 යි)

## 2019

**4.** (i) *A* - කුඩා ස්තූප ආවරණය කිරීම සඳහා තැනූ ගොඩනැගිල්ල
*B* - වැවක ඇතිවන දිය රැළිවලින් වැව් බැම්ම සේදී යාම වැලැක්වීම සඳහා කළ නිර්මාණය
*C* - අකුණු සැරවලින් ආරක්ෂා වීම සඳහා විශාල ස්තූප මුදුනේ සවි කළ උපකරණය
**පිළිවෙළින්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) *A* - මහවැලි ගඟ හා සම්බන්ධ පැරණි ඇළ මාර්ග **දෙකක්** ද
*B* - කලා ඔය හා මල්වතු ඔය හරස්කොට බඳවන ලද විශාල වැවක් බැගින් ද ලියා දක්වන්න.
(ලකුණු 04 යි)

(iii) උද්‍යාන අලංකරණය, ආරක්ෂාව වැනි කරුණු පදනම් කරගෙන පැරණි නගර නිර්මාණ තාක්ෂණයක් පැවති බව සීගිරිය ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 05 යි)

(iv) අතීතයේ දී මෙරට දියුණු වෛද්‍ය සේවාවක් පැවති බව කරුණු **තුනක්** ඉදිරිපත් කරමින් විස්තර කරන්න.
(ලකුණු 06 යි)

## 2020

**4.** (i) අනුරාධපුර යුගයේ දී මහා වාරිමාර්ග පද්ධති නිර්මාණය කිරීම සඳහා යොදාගත් ගංගාධාර **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත *A* සිට *D* දක්වා ඇති ප්‍රකාශවලට ගැළපෙන පිළිතුරු වරහන තුළින් තෝරා **අනුපිළිවෙළින්** ලියා දක්වන්න.
*A* - අභයගිරි විහාරයට අයත්, කලාව හා තාක්ෂණය අතින් විශිෂ්ට ගණයේ නිර්මාණයක් වන පොකුණ
*B* - මින්නේරිය සහ කවුඩුල්ල යන වැව්වලට ජලය ගෙන යන ඇළ මාර්ගය
*C* - වැවක රොන්මඩ ඉවත් කිරීමට හැකි වන පරිදි වැව් බැම්මේ පහළ මට්ටමක ඉදිකර ඇති විවරය
*D* - භික්ෂූන් වහන්සේලාගේ පොහොය කර්මය සඳහා ඉදිකොට ඇති මහා විහාරයට අයත් මහල් කිහිපයකින් යුත් ගොඩනැගිල්ල
(ලෝවා මහා ප්‍රාසාදය, සත්මහල් ප්‍රාසාදය, රළපනාව, මඩ සොරොව්ව, ඇළහැර ඇළ, අඟමැඩිල්ල ඇළ, ඇත් පොකුණ, කුට්ටම් පොකුණ) (ලකුණු 04 යි)

(iii) කුඩා ගම් වැව් පද්ධති (එල්ලංගාව) වියළි කලාපයේ ඉදිකිරීමෙන් සපුරාගැනීමට බලාපොරොත්තු වූ අරමුණු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) දෙවන නාගරීකරණ යුගයේ දී විශාල වාරිමාර්ග පද්ධති බිහි **නොවීමට** බලපෑ සාධක **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**2023 - 2024**

**4.** (i) අනුරාධපුර රාජධානි සමයේදී වියළි කලාපයේ ඉදිකරන ලද මහවැව් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) වියළි කලාපයේ මහවැව් ඉදිකිරීමට හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) වැව් බැම්ම ඉදිකිරීමේදී භාවිත කළ තාක්ෂණය නිදසුන් **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) වැවක ප්‍රධාන අංග වන *A* - රළපනාව, *B* - සොරොව්ව, *C* - බිසෝකොටුව මගින් සිදුවන කාර්යයන් පිළිවෙළින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## 06. ඓතිහාසික දැනුම හා එහි ප්‍රායෝගික ආදේශනය

**ප්‍රශ්න පැමිණීම - 2024**

**5.** (i) මෙරට පැරණි සමාජ සංවිධාන ධූරාවලියේ ඉහළම ස්ථරයේ සිටි පාර්ශව **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) අතීතයේ අභ්‍යන්තර වෙළෙඳාම සම්බන්ධයෙන් පනවා තිබූ නීති **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) අතීත පාලකයින් පරිසරය ආරක්ෂා කරගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) මෙරට පැරණි සමාජය තුළ කාන්තාවන්ට ගෞරවනීය තත්ත්වයක් හිමි වූ බව නිදසුන් **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## 07. වියළි කලාපයේ පැරණි නගර පිරිහීම හා නිරතදිග නව රාජධානි බිහිවීම

**ප්‍රශ්න පැමිණීම - 2016 / 2017 / 2018 / 2020 / 2021-22**

**2016**

**5.** (i) පහත *A*, *B* හා *C* යටතේ දක්වා ඇති කාර්ය හා සම්බන්ධ වන පාලකයන් කවුරුන් දැයි අනුපිළිවෙළින් සඳහන් කරන්න.

*A* - අනුරාධපුරය සියලු නගරාංගවලින් යුත් පාලන මධ්‍යස්ථානයක් බවට පත් කිරීම

*B* - සීගිරිය තම පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීම

*C* - රජරට චෝල ආධිපත්‍යයෙන් මුදා ගෙන, පාලන මධ්‍යස්ථානය ලෙස පොළොන්නරුව තෝරා ගැනීම (ලකුණු 03 යි)

(ii) *A* - ඓතිහාසික මායා රටට අයත් දෙවන නාගරීකරණ පාලන මධ්‍යස්ථාන **දෙකක්** ද

*B* - ඓතිහාසික මලය රටට අයත් දෙවන නාගරීකරණ පාලන මධ්‍යස්ථාන **දෙකක්** ද

සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) දෙවන නාගරීකරණ යුගයේ පාලන මධ්‍යස්ථාන තෝරා ගැනීම සම්බන්ධයෙන් බලපෑ මූලික කරුණු **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) හයවන පරාක්‍රමබාහු රජතුමා ශ්‍රේෂ්ඨ පාලකයකු ලෙස සැලකීමට තුඩු දුන් සාධක **තුනක්** දක්වා, ඒවා සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

## 2017

**5.** (i) ශ්‍රී ලංකාවේ පළමුවැනි නාගරීකරණ අවධියට අයත් පැරණි පරිපාලන නගර **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පළමුවැනි නාගරීකරණ අවධියට අයත් පැරණි නගර පරිහානියට බලපෑ හේතු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) දඹදෙණි රාජධානියේ රජ කළ දෙවන පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය කාලයේ වැදගත්කම කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) දෙවන නාගරීකරණ අවධියේදී ශ්‍රී ලංකාවේ ආර්ථික රටාවේ ඇතිවූ වෙනස්කම් **තුනක්** නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## 2018

**4.** (i) *A* - රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසුව ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ බිහි වූ රාජධානියේ නම

*B* - එම රාජධානියේ පාලක පරපුර හැඳින්වූ නම

*C* - වියළි කලාපයේ තැනින් තැන බිහි වූ කුඩා පාලන ඒකක හැඳින්වූ නම

පිළිවෙළින් දක්වන්න. (ලකුණු 03 යි)

(ii) *A* - දෙවන නාගරීකරණ යුගයේදී උස් පර්වත ආශ්‍රිත ව ඉදිකරන ලද පාලන මධ්‍යස්ථාන **දෙකක්** ද

*B* - කඳුවැටි හා ගංගා ආශ්‍රිත ව ඉදිකරන ලද පාලන මධ්‍යස්ථාන **දෙකක්** ද නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) දෙවන නාගරීකරණ යුගයේදී, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ වෙළෙඳාමේ ස්වභාවය කරුණු **දෙකක්** යටතේ විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජතුමා

*A* - රටේ දේශපාලන ස්ථාවරත්වයක් ඇති කිරීමට කටයුතු කළ ආකාරය ගැන ද

*B* එතුමාගේ රාජ්‍ය සමයේදී රටෙහි ඇති වූ අධ්‍යාපන හා සාහිත්‍ය දියුණුව පිළිබඳව ද

කෙටි විස්තරයක් සපයන්න. (ලකුණු 06 යි)

## 2020

**4.** (iv) දෙවන නාගරීකරණ යුගයේ දී විශාල වාරිමාර්ග පද්ධති බිහි නොවීමට බලපෑ සාධක තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## 2020-22

**4.** (i) දෙවන නාගරීකරණ අවධියේ පැවැති රාජධානි **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පළමුවන නාගරීකරණ අවධියට අයත් පැරණි නගර පරිහානියට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) දෙවන නාගරීකරණ අවධියේ ශ්‍රී ලංකාවේ ආර්ථික රටාවේ දක්නට ලැබුණු ලක්ෂණ **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) ශ්‍රේෂ්ඨ පාලකයකු ලෙස හයවන පරාක්‍රමබාහු රජතුමාගෙන් ඉටු වූ සේවාවන් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

# 08. මහනුවර රාජධානිය

**ප්‍රශ්න පැමිණීම - 2016 / 2017 /2018 / 2020 / 2021-22 / 2022-23 / 2023-24**

## 2016

**6.** (i) *A* - මුල්වරට මහනුවර ස්වාධීන රාජධානියක් පිහිටු වූ රජතුමා
*B* - ක්‍රි.ව. 1580 දී උඩරට ආක්‍රමණය කළ සීතාවක පාලකයා
*C* - දෝන කතිරිනා නමින් බෞතීස්ම ලැබූ කරලියද්දේ බණ්ඩාරගේ දියණිය
කවුරුන් දැයි *A*, *B* හා *C* අනුපිළිවෙළින් ලියා දක්වන්න. (ලකුණු 03 යි)

(ii) *A* - රජ වාසල ප්‍රයෝජනය සඳහා වෙන් කළ ඉඩම්
*B* - බෞද්ධ විහාරවල නඩත්තුව සඳහා පූජා කළ ඉඩම්
*C* - රදළ ප්‍රධානීන් කළ සේවය වෙනුවෙන් ලබා දුන් ඉඩම්
*D* - දේවාලවල නඩත්තුව සඳහා වෙන් කළ ඉඩම්
කවර නම්වලින් හැඳින්වූයේ දැයි *A*, *B*, *C* හා *D* අනුපිළිවෙළින් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) පළමුවන විමලධර්මසූරිය රජතුමා මහනුවර රාජධානියේ තම නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග **දෙකක්** සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) පෘතුගීසි හා ලන්දේසි ජාතිකයන් විසින් මහනුවර රාජධානිය යටත් කර ගැනීමට කරන ලද ආක්‍රමණ අසාර්ථක වීමට බලපෑ හේතු **තුනක්** සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

## 2017

**6.** (i) කන්ද උඩරට රාජ්‍යයේ අගනගරය වූ මහනුවර ආරක්ෂාව සම්බන්ධයෙන් වැදගත්වන
(a) ගංගාව
(b) දුර්ග මාර්ග **දෙකක්**
අනුපිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත සඳහන් තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන්දැයි අනුපිළිවෙළින් සඳහන් කරන්න.
*A* - සීතාවක රාජසිංහ රජු උඩරට ආක්‍රමණය කරන විට එහි සිටි පාලකයා
*B* - නව රාජ වංශයක් ආරම්භ කළ උඩරට පාලකයා
*C* - ක්‍රි.ව. 1602 දී මහනුවරට පැමිණි ලන්දේසි දූත කණ්ඩායමේ ප්‍රධානියා
*D* - ක්‍රි.ව.1766 දී ලන්දේසීන් සමග ගිවිසුමක් ඇති කර ගත් උඩරට රජතුමා (ලකුණු 04 යි)

(iii) මහනුවර රාජධානියේ ප්‍රාදේශීය පාලනය සංවිධානය වූ ආකාරය කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) මහනුවර රාජධානියේ සමාජ සංවිධානයෙහි කැපී පෙනුණු ලක්ෂණ **තුනක්** නිදසුන් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

## 2018

**5.** (i) මහනුවර රාජධානියට අයත්ව තිබූ පාලන ප්‍රදේශ අතුරෙන් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) මහනුවර යුගයේ පහත සඳහන් කාර්යයන් භාරව කටයුතු කළ තැනැත්තන්ගේ නිල නාම වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියා දක්වන්න.
*A* - රජතුමාගේ අලි ඇතුන් භාරව කටයුතු කිරීම
*B* - රජවාසලට ආහාර පාන සැපයීම
*C* - රජතුමාගේ ඇඳුම් හා ආභරණ භාරව කටයුතු කිරීම
*D* - කුඩා ම පරිපාලන ඒකකය වූ ගමක් භාරව කටයුතු කිරීම
[විදානේ, කෝරාළ, සළුවඩන නිලමේ, ගජනායක නිලමේ, බත්වඩන නිලමේ, කොඩිතුවක්කු නිලමේ, දියවඩන නිලමේ] (ලකුණු 04 යි)

(iii) උඩරට සමාජයේ පැවති විවාහ ක්‍රම පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 05 යි)

(iv) මහනුවර රාජධානි සමයේ
*A* - කෘෂිකර්මය
*B* - කර්මාන්ත
සංවිධානය වී තිබූ ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)

## 2020

5. (i) විජයබා කොල්ලය හා සම්බන්ධ වූ කුමාරවරුන් තිදෙනා නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) උඩරට රාජ්‍ය සම්බන්ධයෙන් පහත *A*, *B*, *C* හා *D* යටතේ ඇති ප්‍රකාශවලට ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා **අනුපිළිවෙළින්** ලියා දක්වන්න.

*A* - දේශපාලන වශයෙන් රජුට පමණක් දෙවෙනි වූ මහවාසල නිලධාරියා

*B* - දන්ත ධාතූන් වහන්සේගේ හා දළදා මාලිගාවේ කටයුතු භාර වූ පුද්ගලයා

*C* - පළමු සංඝරාජ මාහිමියන් වහන්සේ

*D* - උඩරට රාජ්‍යය සතු වූ වර්තමාන උතුරුමැද පළාතට ප්‍රමාණයෙන් සමාන වන ප්‍රදේශය

(නුවරකලාවිය, තමන්කඩුව, හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, වැලිවිට ශ්‍රී සරණංකර හිමි, බස්නායක නිලමේ, දියවඩන නිලමේ, අධිකාරම්, මහ දිසාව) (ලකුණු 04 යි)

(iii) උඩරට රාජ්‍යයේ කෘෂිකාර්මික කටයුතු සංවිධානය වී තිබූ ආකාරය කරුණු **දෙකක්** යටතේ විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) පළමුවන විමලධර්මසූරිය රජතුමා මහනුවර රාජ්‍යයේ සිටි ශ්‍රේෂ්ඨ පාලකයෙකු බව සාධක තුනක් ඔස්සේ පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## 2021-22

5. (i) මහනුවර රාජධානිය හැඳින්වීම සඳහා භාවිත කළ නම් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත *A* සිට *D* දක්වා ඇති ප්‍රකාශවලට ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා **අනුපිළිවෙළින්** ලියා දක්වන්න.

*A* - මහනුවර රාජධානියේ ආරම්භක පාලකයා

*B* - මහනුවර රාජධානිය ආක්‍රමණය කිරීම සඳහා සීතාවක රාජසිංහ රජුට සහාය ලබාදුන් ප්‍රභූවරයා

*C* - දෝන කතිරිනා නමින් බෞතීස්ම ලැබූ කුමාරිකාව

*D* - ක්‍රි.ව. 1766 දී ලන්දේසීන් සමග ගිවිසුමක් ඇති කරගත් රජතුමා

(කරලියද්දේ බණ්ඩාර, කීර්ති ශ්‍රී රාජසිංහ, කුසුමාසන දේවිය, වීරසුන්දර බණ්ඩාර, සේනා සම්මත වික්‍රමබාහු, සමුද්‍ර දේවිය, ශ්‍රී විජය රාජසිංහ, ජයවීර බණ්ඩාර) (ලකුණු 04 යි)

(iii) දෙවන රාජසිංහ රජු තම පාලන සමයේදී මුහුණදුන් අභියෝග **දෙකක්** සඳහන් කර, ඉන් **එකක්** ජයගැනීම සඳහා කටයුතු කළ ආකාරය සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) මහනුවර රාජධානියේ පරිපාලන කටයුතු සංවිධානය වී තිබූ ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## 2022-23

5. (i) මහනුවර රාජධානියේ ක්‍රියාත්මක වූ බද්දේ සංවිධාන **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) මහනුවර රාජධානියේ වැරදිකරුවන්ට ලබාදුන් දඬුවම් **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) මහනුවර රාජධානියේ ආර්ථික රටාවේ ලක්ෂණ **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) මහනුවර රාජධානියේ සමාජ සංවිධානයේ දක්නට ලැබුණු ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## 2023-24

6. (i) මහනුවර රාජධානියේ අගනගරයට ස්වාභාවික ආරක්ෂාව ලැබුණු

(*a*) ගංගාව හා

(*b*) දුර්ග මාර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) මහනුවර රාජධානිය පාලනය කළ නායක්කර් වංශික රජවරු **හතරදෙනා** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) පළමුවන විමලධර්මසූරිය රජු මහනුවර රාජධානියේ නීත්‍යනුකූල අයිතිය තහවුරු කරගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) මහනුවර රාජධානියේ අධිකරණ කටයුතු ක්‍රියාත්මක වූ ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## 09. පුනරුදය

### ප්‍රශ්න පැමිණීම - 2018 / 2020

**2018**

**8.** (i) පුනරුදය නිසා ප්‍රසිද්ධියට පත් ඉතාලියේ නගර **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) *A* - පෘථිවිය ගෝලාකාර බව සොයාගැනීම

*B* - දුරේක්ෂය නිපදවීම

*C* - ගුරුත්වාකර්ෂණ නියමය සොයා ගැනීම

*D* - මුද්‍රණ යන්ත්‍රය නිපදවීම

සම්බන්ධ පුද්ගලයන් කවුරුන් දැයි පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) *A* - මානව වාදය යන්නෙන් කුමක් අදහස් කෙරේ ද?

*B* - පුනරුද සමයේ ප්‍රසිද්ධියට පත් චිත්‍ර නිර්මාණ **තුනක්** නම් කරන්න. (ලකුණු 05 යි)

(iv) දේශ ගවේෂණයේ ප්‍රතිඵල **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

**2019**

**8.** (i) ක්‍රි.ව. 1453 දී තුර්කීන් අත්පත් කරගත්, ග්‍රීක-රෝම උගතුන් අධ්‍යයන කටයුතුවල නිරත වූ නගරය කුමක් ද? (ලකුණු 01 යි)

(ii) වෙළෙඳ හා වාණිජ කටයුතු නිසා ප්‍රසිද්ධියට පත් ඉතාලියේ නගර **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) (a) පුනරුද සමයේ ගෘහ නිර්මාණ ශිල්පයේ විශේෂ ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(b) පුනරුද සමයේ විශ්වය පිළිබඳ ඉදිරිපත් වූ නව මත **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iv) පුනරුද සමයේ ඉතාලියේ බිහිවූ චිත්‍ර හා මූර්ති කලාවේ විශේෂ ලක්ෂණ **දෙකක්** නිදසුන් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(v) දේශ ගවේෂණ නිසා ලෝකයේ ඇති වූ දේශපාලන වෙනස්කම් සහ ආර්ථික වෙනස්කම් **එක** බැගින් දක්වා ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## 10. ශ්‍රී ලංකාව හා බටහිර ලෝකය

### ප්‍රශ්න පැමිණීම - 2019 / 2022-23

**2019**

**5.** (i) පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණෙන විට තිබූ රාජධානි **තුන** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත *A* සිට *D* දක්වා ඇති ප්‍රකාශවලට ගැළපෙන පිළිතුරු වරහන තුළින් තෝරා **අනුපිළිවෙළින්** දක්වන්න.

*A* - ක්‍රි.ව. 1505 දී ගාල්ලට ගොඩබට පළමු පෘතුගීසි නාවිකයා

*B* - ක්‍රි.ව. 1602 දී පළමුවන විමලධර්මසූරිය රජු හමුවීමට පැමිණි ලන්දේසි රාජ දූතයා

*C* - ක්‍රි.ව. 1638 දී ලන්දේසීන් සමග ගිවිසුමක් ඇතිකරගත් උඩරට රජතුමා

*D* - ක්‍රි.ව. 1762 දී කීර්ති ශ්‍රී රාජසිංහ රජු හමුවීමට පැමිණි ඉංග්‍රීසි රාජ දූතයා

(ජෝන් පයිබස්, රොබට් ඇන්ඩෘස්, ලොරෙන්සෝ ද අල්මේදා, ෆ්‍රැන්සිස්කු ද අල්මේදා, දෙවන රාජසිංහ, ශ්‍රී වික්‍රම රාජසිංහ, ජෝරිස් ෆන් ස්පිල්බර්ජන්, සීබල් ද වාර්ට්) (ලකුණු 04 යි)

(iii) පෘතුගීසි ජාතිකයන්ට හා ලන්දේසි ජාතිකයන්ට උඩරට රාජධානිය යටත් කර ගැනීමට නොහැකි වූයේ ඇයිදැයි කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**2022-23**

**4.** (i) විජයබා කොල්ලයෙන් පසු කෝට්ටේ රාජ්‍යය බෙදුන කොටස් **තුන** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත දැක්වෙන කරුණුවලට ගැළපෙන පිළිතුරු ලියන්න.

*A* - පැළෑඳ ප්‍රදේශයේ බලකොටුවක් ඉදිකර පෘතුගීසි විරෝධී අරගලයක් ආරම්භ කළ තැනැත්තා

*B* - තෑගි ඔප්පුවකින් තම රාජ්‍ය උරුමය පෘතුගීසීන්ට පැවරූ රජතුමා

*C* - ආසියාවේ ලන්දේසි කටයුතු මෙහෙය වූ වෙළෙඳ සමාගම

*D* - ක්‍රි.ව. 1764 දී උඩරට ආක්‍රමණය මෙහෙය වූ ලන්දේසි ආණ්ඩුකාරවරයා (ලකුණු 04 යි)

(iii) පෘතුගීසීන් මහනුවර රාජ්‍යය අල්ලා ගැනීමට දරණ ලද ප්‍රයත්න **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) ලන්දේසීන් මහනුවර රාජ්‍යය සමග සම්බන්ධතා පවත්වා ගැනීමේ දී අනුගමනය කළ ප්‍රතිපත්ති **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

# 01. කාර්මික විප්ලවය

## ප්‍රශ්න පැමිණීම - 2017 /2019 / 2020/ 2021-22 / 2023-24

**2017**

**8.** (i) බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවය ප්‍රධාන කර්මාන්ත තුනක් ආශ්‍රිතව ආරම්භ විය. ඒවා නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) කාර්මික විප්ලව සමයේ (*A*) සන්නිවේදන හා (*B*) ප්‍රවාහන යන ක්ෂේත්‍රයන්හි ඇතිවූ නව නිමැවුම් **දෙක** බැගින් පිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) කාර්මික විප්ලවය නිසා ලෝකයේ සමාජ ක්ෂේත්‍රයේ හටගත් වෙනස්කම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) කාර්මික විප්ලවය ශ්‍රී ලංකාව කෙරෙහි බලපෑ ආකාරය නිදසුන් **තුනක්** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**2019**

**8.** (i) දහඅටවන ශතවර්ෂය වන විට යටත් විජිත පිහිටුවා ගෙන සිටි යුරෝපීය රටවල් **තුනක්** (බ්‍රිතාන්‍යය හැර) සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) කාර්මික විප්ලව සමයේ ඇති වූ නව නිපැයුම් කිහිපයක් පහත දැක්වේ. ඒ හා සම්බන්ධ පුද්ගලයන් වරහනින් තෝරා **අනුපිළිවෙළින්** දක්වන්න.

*A* - දුවන නඩාව

*B* - ආරක්ෂක ලාම්පුව

*C* - දුම් නැව

*D* - විදුලි පණිවුඩ ක්‍රමය

(ජෝන් කේ, ශුග්ලි මාර්කෝනි, සැමුවෙල් මෝස්, හෙන්රි බෙල්, රොබට් පුල්ටන්, තෝමස් නිව්කොමන්, හම්ප්‍රි ඩේවි, සැමුවෙල් ක්‍රොම්ප්ටන්) (ලකුණු 04 යි)

(iii) කාර්මික විප්ලව සමයේ බ්‍රිතාන්‍යයේ යකඩ හා වානේ කර්මාන්තයේ ඇති වූ දියුණුව නිදසුන් **දෙකක්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) කාර්මික විප්ලවයේ බලපෑම් හේතුවෙන් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඇති වූ වර්ධනය කරුණු **තුනක්** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## 2020

9. (i) කාර්මික විප්ලවයේ ආරම්භයට උපකාරී වූ අමුද්‍රව්‍ය, නිමි භාණ්ඩ හා මූල්‍ය කටයුතු සම්පාදනයේදී මූලිකත්වය දැරූ බ්‍රිතාන්‍ය නගරය කුමක් ද? (ලකුණු 01 යි)

(ii) කාර්මික විප්ලව සමයේ බහුල වශයෙන් භාවිත කළ ඛනිජ වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) කාර්මික විප්ලව සමයේ දී නිපද වූ නව නිපැයුම් කිහිපයක් පහත දැක්වේ. ඒවාට සම්බන්ධ පුද්ගලයන් කවුරුන්දැයි වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් දක්වන්න.

*A* - දුම්රිය එන්ජිම

*B* - ගුවන් විදුලි යන්ත්‍රය

*C* - මෝටර් රථය

*D* - ගුවන් යානය

(හෙන්රි ෆෝඩ්, ඩෙම්ලර්, සැමුවෙල් මෝස්, ගුග්ලි මාර්කෝනි, ජෝර්ජ් ස්ටීවන්සන්, ජේම්ස් වොට්, රයිට් සහෝදරයෝ, ලෙගී බෙයාර්ඩ්) (ලකුණු 04 යි)

(iv) කාර්මික විප්ලව සමයේ එංගලන්තයේ පේෂ කර්මාන්තයේ ශීඝ්‍ර දියුණුවට බලපෑ හේතු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(v) කාර්මික විප්ලවයේ බලපෑමේ ප්‍රතිඵල වශයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ සහ සන්නිවේදන ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් එක බැගින් නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 06 යි)

## 2021-22

8. (i) බ්‍රිතාන්‍යයේ ආරම්භ වූ කාර්මික විප්ලවය ව්‍යාප්ත වූ යුරෝපා රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) කාර්මික විප්ලවය පළමුව බ්‍රිතාන්‍යයෙන් ආරම්භ වීමට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) කාර්මික විප්ලව සමයේ බ්‍රිතාන්‍යයේ ගල් අඟුරු කර්මාන්තයේ ඇති වූ දියුණුව නිදසුන් **දෙකක්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස ලෝක ආර්ථික ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

## 2023-24

9. (i) බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවය ආරම්භ වූ ප්‍රධාන කර්මාන්ත **තුන** ලියන්න. (ලකුණු 03 යි)

(ii) බ්‍රිතාන්‍යයෙන් ආරම්භ වූ කාර්මික විප්ලවය වෙනත් රටවල් කරා ව්‍යාප්ත වීමට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) කාර්මික විප්ලවයේ බලපෑම් නිසා ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඇති වූ දියුණුව නිදසුන් **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස සමාජ ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්වීම් කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

# 02. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම

ප්‍රශ්න පැමිණීම - 2016 / 2018 / 2019/ 2020 / 2021-22

## 2016

7. (i) බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් ඉන්දියාවේ පිහිටුවනු ලැබූ වෙළෙඳ මධ්‍යස්ථාන **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ශ්‍රී ලංකාව කෙරෙහි බ්‍රිතාන්‍යයන්ගේ අවධානය යොමු වීමට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත් යටත් කර ගත් බ්‍රිතාන්‍යයන්ට, මහනුවර රාජධානිය අත්පත් කර ගැනීමට අවශ්‍ය වූයේ ඇයි දැයි කරුණු **දෙකක්** ඇසුරෙන් සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) ක්‍රි.ව. 1818 බ්‍රිතාන්‍ය විරෝධී අරගලයක් ඇති වීමට බලපෑ හේතු **තුනක්** සැකෙවින් විස්තර කරන්න.(ලකුණු 06 යි)

**2018**

6. (i) ඉන්දියානු සාගරය අවට රටවල වෙළෙඳ තරගයක යෙදී සිටි යුරෝපා ජාතීන් **තුනක්** (බ්‍රිතාන්‍යයන් හැර) නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ත්‍රිකුණාමල වරාය බ්‍රිතාන්‍යයන්ට වැදගත් වීමට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ක්‍රි.ව. 1815 දී වැඩි ආයාසයකින් තොරව බ්‍රිතාන්‍යයන්ට උඩරට යටත් කර ගැනීමට හැකිවූයේ ඇයි දැයි කරුණු **දෙකක්** යටතේ පෙන්වා දෙන්න. (ලකුණු 05 යි)

(iv) උඩරට යටත් කර ගැනීමෙන් වසර තුනක් පමණ කාලයක් ගත වන විට, ජාතික නිදහස් සටන් ව්‍යාපාරයක් ආරම්භ වීමට තුඩු දුන් හේතු **තුනක්** දක්වා ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

**2019**

(iv) ක්‍රි.ව. 1818 උඩරට ඇති වූ නිදහස් සටන් ව්‍යාපාරය පිළිබඳව පහත දැක්වෙන ශීර්ෂ යටතේ කෙටි විස්තරයක් කරන්න.

5. *A* - එයට බලපෑ පසුබිම

*B* - නායකත්වය

*C* - සටන් ව්‍යාපාරය අසාර්ථක වීමට හේතු

**2020**

7. (i) පහත *A*, *B* සහ *C* හි දැක්වෙන අවස්ථාවලට සම්බන්ධ පුද්ගලයන් අනුපිළිවෙළින් නම් කරන්න.

*A* - ශ්‍රී ලංකාවේ මුල්ම බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා

*B* - වර්ෂ 1818 උඩරට නිදහස් සටන පැවති අවධියේ මෙරට ආණ්ඩුකාරවරයා

*C* - වර්ෂ 1848 නිදහස් සටන පැවති අවධියේ මෙරට ආණ්ඩුකාරවරයා (ලකුණු 03 යි)

**2021-22**

6. (i) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍යයන් විසින් අත්පත් කරගැනීමට පෙර මෙරටට පැමිණි බ්‍රිතාන්‍ය දූතයන් **තිදෙනා** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ක්‍රි.ව. 1797 දී මුහුදුබඩ ප්‍රදේශවල ඇති වූ කැරැල්ල පිළිබඳ සොයා බැලූ මියුරන් කොමිසමේ නිර්දේශ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) බ්‍රිතාන්‍යයන් විසින් මහනුවර රාජධානිය යටත් කරගැනීමට තුඩුදුන් සාධක **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) ක්‍රි.ව. 1848 දී බ්‍රිතාන්‍ය විරෝධී නිදහස් අරගලයක් ඇතිවීමට බලපෑ හේතු **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

## 03. ශ්‍රී ලංකාවේ ජාතික පුනරුදය

**(2016 – 2024 දක්වා රචනා ප්‍රශ්න පැමිණ නැත)**

## 04. බ්‍රිතාන්‍යන් යටතේ ශ්‍රී ලංකාවේ දේශපාලන වෙනස්වීම

### ප්‍රශ්න පැමිණීම - 2017 / 2020

**2017**

7. (i) පහත සඳහන් එක් එක් දේශපාලන වෙනස්කම් සිදුවූයේ කවර ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේදැයි වරහන් තුළින් තෝරා *A*, *B* හා *C* අනුපිළිවෙළින් සඳහන් කරන්න.

*A* - ව්‍යවස්ථාදායක සභාවට ප්‍රථම වරට සීමිත ඡන්ද බලයෙන් නියෝජිතයන් පත් කිරීම

*B* - සාමාජිකයන් 61 දෙනකුගෙන් යුත් රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම

*C* - සාමාජිකයන් 30 දෙනකුගෙන් යුත් සෙනෙට් සභාව ස්ථාපිත කිරීම

(ක්‍රි.ව.1833-කෝල්බෲක්, ක්‍රි.ව.1910-කෲව් මැකලම්, ක්‍රි.ව.1931-ඩොනමෝර්, ක්‍රි.ව.1947 සෝල්බරි) (ලකුණු 03 යි)

(ii) 1833 කොල්බෲක් ප්‍රතිසංස්කරණ මගින් සිදු කළ පරිපාලන වෙනස්කම් **දෙකක්** හා ආර්ථික වෙනස්කම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

**2020**

7. (ii) (a) යටත්විජිත භාර මහලේකම්වරයා විසින් කෝල්බෲක් කොමිසම මෙරටට එවීමට පාදක වූ හේතුවක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(b) ආණ්ඩුකාරවරයාගේ බලතල අඩු කිරීම පිණිස කෝල්බෲක් කොමිසම ඉදිරිපත් කළ යෝජනාව කුමක් ද? (ලකුණු 02 යි)

(iii) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය මගින් ශ්‍රී ලාංකික පුරවැසියන්ට ලැබුණු ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය සඳහන් කොට, එමගින් ශ්‍රී ලාංකිකයන්ට අත්වුණු වාසි දෙකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

## 05. බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ සමාජ පරිවර්තනය

**ප්‍රශ්න පැමිණීම - 2017/ 2019 / 2020 / 2022-23/ 2023-24**

**2017**

7. (iii) බ්‍රිතාන්‍ය පාලනය නිසා මෙරට සිදුවූ සමාජමය වෙනස්කම් **දෙකක්** සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

**2019**

6. (i) බ්‍රිතාන්‍යයන් විසින් මෙරට කඳුකර ප්‍රදේශවල අරඹන ලද වතුබෝග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) වතුවගාව බහුල වශයෙන් ව්‍යාප්ත වූ කඳුකර දිස්ත්‍රික්ක **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)

(iii) වතුවගාවේ දියුණුවට හේතු වූ කෝල්බෲක් යෝජනා **දෙකක්** සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) වතුවගාව නිසා මෙරට ඇති වූ ආර්ථික හා සමාජමය වෙනස්කම් **එක** බැගින් දක්වා, ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

**2020**

6. (i) ලන්දේසීන් විසින් ප්‍රථමවරට මෙරට වතුවගාවක් ලෙස ආරම්භ කළ බෝගය කුමක් ද? (ලකුණු 01 යි)

(ii) බ්‍රිතාන්‍යයන් විසින් උඩරට ආරම්භ කරන ලද එහෙත් පසුව අසාර්ථක වූ බෝග වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) (a) වතුවගාව ආරම්භ කිරීමේ දී ව්‍යාපාරිකයන්ට මුහුණදීමට සිදු වූ ප්‍රධාන අභියෝග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(b) එම අභියෝග විසඳාගැනීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙක සඳහන් කරන්න. (ලකුණු 02 යි)

**2022-23**

6. (i) බ්‍රිතාන්‍යයන් යටතේ කෝපි වගාව ව්‍යාප්ත වූ ප්‍රදේශ **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) කෝපි වගාවේ පරිහානියට බලපෑ හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iii) තේ වගාවේ දියුණුවට බලපෑ සාධක **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) වතු වගාව හඳුන්වාදීම නිසා මෙරට ආර්ථිකයට හිතකර හා අහිතකර බලපෑම් සිදු වූ බව කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**2023-24**

7. (i) බ්‍රිතාන්‍ය පාලන සමයේ ඉංග්‍රීසි උගත් ශ්‍රී ලාංකිකයන්ට විවෘත වූ නව රැකියා අවස්ථා **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) බ්‍රිතාන්‍ය පාලනයට පෙර මෙරට ජන සමාජය තුළ මුදල් භාවිතය සුලභ නොවීමට හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iii) බ්‍රිතාන්‍ය පාලනය හේතුවෙන් මෙරට සමාජයෙහි ඇති වූ **අහිතකර** බලපෑම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) බ්‍රිතාන්‍ය පාලනය තුළින් මෙරටට ලැබුණු යහපත් ප්‍රතිඵල **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

# 06. ශ්‍රී ලංකාවට නිදහස ලැබීම

## ප්‍රශ්න පැමිණීම - 2017 / 2018 / 2019 / 2020 / 2021-22

### 2017

7. (iv) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආරම්භ කළ බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රම **දෙකක්** නම් කර, ඒවා මෙරට ආර්ථික සංවර්ධනයට දායක වූ ආකාරය කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

### 2018

7. (i) ශ්‍රී ලංකාවේ
   A - නායකයන්ට කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ තීරණ ගැනීමට අවස්ථාව ලැබුණු මුල්ම ආණ්ඩු ක්‍රමය ද
   B - ගොවි ජනපද ව්‍යාපාරයේ පියා වශයෙන් සැලකෙන ජන නායකයා ද
   C - ආරම්භ කරන ලද ප්‍රථම බහුකාර්ය යෝජනා ක්‍රමය ද
   පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 03 යි)
   (ii) ගොවි ජනපද ව්‍යාපාර ඇති කිරීමෙන් බලාපොරොත්තු වූ අරමුණු **දෙකක්** දක්වන්න. (ලකුණු 04 යි)
   (iii) කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපාර සඳහා ඉතාමත් සුදුසු වන්නේ ශ්‍රී ලංකාවේ වියළි කලාපය බව කරුණු **දෙකක්** ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 05 යි)
   (iv) "බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමයක් සඳහා ශ්‍රී ලංකාවේ අනෙකුත් ගංගාවලට වඩා මහවැලි ගඟ විශේෂත්වයක් උසුලයි." මේ බව කරුණු **තුනක්** යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

### 2019

7. (i) A - නිදහස් ශ්‍රී ලංකාවේ පළමු අගමැති
   B - ක්‍රි.ව. 1972 ශ්‍රී ලංකා ජනරජයේ අගමැති
   C - ක්‍රි.ව. 1978 ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රථම විධායක ජනාධිපති
   **පිළිවෙළින්** නම් කරන්න. (ලකුණු 03 යි)
   (ii) ක්‍රි.ව. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වාදුන් නව ඡන්ද විමසීම් ක්‍රම **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
   (iii) නිදහසින් පසු ගත වූ වසර තිහක පමණ කාලය තුළ දී බලයට පත් වූ රජයන් විසින් මෙරට ව්‍යාපාරික කෘෂිකර්මයේ දියුණුවට ගත් ක්‍රියාමාර්ග **දෙකක්** දක්වා, ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)
   (iv) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රයේ දියුණුව සඳහා ගත් ක්‍රියාමාර්ග **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

### 2020

6. (iv) මෙරට ගොවිජනපද ආරම්භ කිරීම සඳහා වියළි කලාපය තෝරාගැනීමේ දී විශේෂත්වයක් ලැබීමට බලපෑ සාධක **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)
   (v) මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයේ අරමුණු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

7. (iv) 1978 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයට අදාළ පහත දී ඇති මාතෘකා අතුරෙන් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
   A - ජනාධිපතිවරණය
   B - සමානුපාතික නියෝජන ක්‍රමය
   C - ජනමත විචාරණය (ලකුණු 06 යි)

### 2021-22

7. (i) නිදහසට පෙර ශ්‍රී ලංකාවේ බිහිවූ දේශපාලන පක්ෂ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
   (ii) ක්‍රි.ව. 1956 දී ශ්‍රී ලංකාවේ බලයට පත් රජය හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
   (iii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ විධායක ජනාධිපතිවරයා සතු බලතල **දෙකක්** සැකෙවින් දක්වන්න. (ලකුණු 05 යි)
   (iv) නිදහසින් පසු මුල් දශක තුන තුළදී ශ්‍රී ලංකාවේ සමාජ සුබසාධනය වැඩිදියුණු කිරීම සඳහා ගෙන ඇති පියවර **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

**2022-23**

7. (i) 1956 මහා මැතිවරණයේ දී ක්‍රියාත්මක වූ පංචමහා බලවේගයට අයත් පාර්ශව **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)
(ii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අඩංගු මූලික මිනිස් අයිතිවාසිකම් **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)
(iii) නිදහසින් පසු ගතවූ දශක තුනක කාලය තුළ බලයට පත් රජයන් අධ්‍යාපනයේ දියුණුව සඳහා ගත් පියවර **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)
(iv) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ රජයන් විසින් වී ගොවිතැන දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## 07. ලෝකයේ කැපී පෙනෙන විප්ලව

**ප්‍රශ්න පැමිණීම - 2016 / 2018 / 2022-23 / 2023-24**

**2016**

8. (i) ප්‍රංශ විප්ලවයට බලපෑ මතවාද ඉදිරිපත් කළ දාර්ශනිකයන් **තිදෙනකු** නම් කරන්න. (ලකුණු 03 යි)
(ii) පහත *A, B, C* හා *D* යටතේ දක්වා ඇති තොරතුරුවලට ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියා දක්වන්න.
*A* - ඇමෙරිකන් විප්ලවය ඇරඹීමට මුල් වූ සිදුවීම
*B* - නිදහස් ඇමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රථම ජනාධිපතිවරයා
*C* - ප්‍රංශ විප්ලව සමයේ එරට සිටි පාලකයා
*D* - රුසියන් විප්ලවයට නායකත්වය දුන් පුද්ගලයා
(වී.අයි. ලෙනින්, දහසයවන ලුවී, නැපෝලියන් බොනපාට්, බොස්ටන් තේ සාදය, ටෙනිස් පිටියේ දිවුරුම, ජෝර්ජ් වොෂින්ටන්, ඒබ්‍රහම් ලින්කන්, ලියොන් ට්‍රොට්ස්කි) (ලකුණු 04 යි)
(iii) ප්‍රංශ විප්ලවයෙන් පසු එරට ඇතිවූ වෙනස්කම් **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)
(iv) රුසියානු විප්ලවය නිසා එරට ඇතිවූ දේශපාලන හා ආර්ථික වෙනස්කම් එක බැගින් නිදසුන් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

**2018**

9. (i) ඇමෙරිකාවේ ජනපද පිහිට වූ යුරෝපා ජාතීන් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)
(ii) ඇමෙරිකානු විප්ලවයට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(iii) ප්‍රංශ විප්ලවයට බලපෑ ආර්ථික හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)
(iv) රුසියානු විප්ලවයේ ප්‍රතිඵල නිසා ලෝක දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් **දෙකක්** නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**2022-23**

8. (i) බ්‍රිතාන්‍යයන් විසින් උතුරු ඇමෙරිකාවේ පිහිටුවන ලද ජනපද **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)
(ii) යුරෝපීයයන් අමෙරිකාවේ ජනපද පිහිටුවීමට මුල් වූ හේතු **දෙකක්** ලියා දක්වන්න. (ලකුණු 04 යි)
(iii) ප්‍රංශ විප්ලවය ඇතිවීමට බලපෑ හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)
(iv) රුසියානු විප්ලවයේ ප්‍රතිඵල **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**2023-24**

8. (i) ඇමෙරිකා මහද්වීපයේ ජනපද පිහිටුවන ලද යුරෝපා රටවල් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(ii) (*a*) ඇමෙරිකානු නිදහස් සටනට තේමා වූ සටන් පාඨය කුමක් ද?
(*b*) රුසියානු විප්ලවයට තේමා වූ සටන් පාඨය කුමක් ද? (ලකුණු 04 යි)
(iii) ඇමෙරිකානු නිදහස් සටනට බලපෑ හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)
(iv) රුසියානු විප්ලවයට බලපෑ හේතු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

# 08. ලෝක මහා සංග්‍රාම හා සම්මුතීන්

## ප්‍රශ්න පැමිණීම - 2016 / 2017 / 2019 / 2021-22 / 2022-23

### 2016

9. (i) යටත් විජිත ඇති කර ගත් යුරෝපා රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත *A*, *B*, *C* හා *D* වලින් දැක්වෙන තොරතුරුවලට අදාළ පිළිතුරු වරහන් තුළින් තෝරා, අනුපිළිවෙළින් ලියා දක්වන්න.

*A* - කුඩා රාජ්‍ය කිහිපයක් එකතු කොට ජර්මනිය නමින් රටක් බිහි කළ තැනැත්තා

*B* - යටත් විජිත ඇති කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළ ජර්මන් අධිරාජයා

*C* - දෙවන ලෝක මහා සංග්‍රාම සමයේ දී මිත්‍ර පක්ෂයට නායකත්වය දුන් බ්‍රිතාන්‍ය අගමැතිවරයා

*D* - දෙවන ලෝක මහා සංග්‍රාමය අවසානයේ දී කොන්දේසි විරහිතව යටත් වීමේ ගිවිසුමට අත්සන් කළ ජපන් අධිරාජයා

(හිරෝහිතෝ, මුට්සුහිතෝ, වින්ස්ටන් චර්චිල්, ලොයිඩ් ජෝර්ජ්, දෙවන විලියම් කයිසර්, ඔටෝ වොන් බිස්මාර්ක්, ඇඩොල්ෆ් හිට්ලර්, ජෝෂප් ස්ටාලින්) (ලකුණු 04 යි)

(iii) ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **දෙකක්** සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) දෙවන ලෝක මහා සංග්‍රාමයේ ප්‍රතිඵල **තුනක්** සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

### 2017

9. (i) පළමුවන ලෝක මහා සංග්‍රාමයේදී මිත්‍ර පිලට අයත් වූ රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත සඳහන් තොරතුරුවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් දක්වන්න.

*A* - පළමුවන ලෝක මහා සංග්‍රාම සමයේදී ඇමෙරිකාවේ සිටි ජනාධිපතිවරයා

*B* - දෙවන ලෝක මහා සංග්‍රාම සමයේදී ජපන් ප්‍රහාරයට ලක්වූ ඇමෙරිකානු වරාය

*C* - දෙවන ලෝක මහා සංග්‍රාමයේදී ජර්මන් වධ කඳවුරුවලදී ඝාතනයට ලක්වූ ජන වර්ගය

*D* - ඇඩෝල්ෆ් හිට්ලර්ගේ රහස් පොලීසිය හැඳින්වූ නම (ලකුණු 04 යි)

(iii) දෙවන ලෝක මහා සංග්‍රාමයට තුඩු දුන් හේතු **දෙකක්** සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) දෙවන ලෝක මහා සංග්‍රාමය නිසා මහත් විනාශකාරී ප්‍රතිඵල ඇති වූ බව කරුණු **තුනක්** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

### 2019

9. (i) *A* - පළමු ලෝක මහා සංග්‍රාමයට සම්බන්ධ වූ රටවල් ගොඩනගා ගත් කඳවුරු **දෙක** ද

*B* - සරයේවෝ සිද්ධියෙන් ඝාතනයට ලක් වූ ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරුගේ නම ද

*A B* **අනුපිළිවෙළින්** දක්වන්න. (ලකුණු 03 යි)

(ii) පහත සඳහන් තොරතුරුවලට අදාළ පිළිතුරු වරහනින් තෝරා **අනුපිළිවෙළින්** දක්වන්න.

*A* - රුසියාව ආක්‍රමණය කර පරාජයට පත් වූ ප්‍රංශ අධිරාජයා

*B* - ක්‍රි.ව. 1934 දී මැංචූරියාවට ආක්‍රමණයක් එල්ල කළ රට

*C* - නාට්සි විරෝධී සටනට බ්‍රිතාන්‍ය ජාතිකයන් පෙළඹ වූ එරට අගමැතිවරයා

*D* - දෙවන ලෝක මහා සංග්‍රාම සමයේ ඇමෙරිකා එක්සත් ජනපදයේ සිටි ජනාධිපතිවරයා

(චාල්ස් ඩිගෝල්, නැපෝලියන් බොනපාට්, වුඩ්රෝ විල්සන්, ලොයිඩ් ජෝර්ජ්, ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට්, ජර්මනිය, ජපානය, වින්ස්ටන් චර්චිල්) (ලකුණු 04 යි)

(iii) පළමුවන හා දෙවන ලෝක මහා සංග්‍රාමයන්ට ඇමෙරිකා එක්සත් ජනපදය සම්බන්ධ වීමට බලපෑ සිදුවීම් **දෙක** සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) ජාතීන්ගේ සංගමයට ලෝක සාමය ආරක්ෂා කර ගැනීමට නොහැකි වීම කෙරෙහි බලපෑ හේතු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## 2021-22

9. (i) පළමුවන ලෝක මහා සංග්‍රාමයට සම්බන්ධ වූ මිත්‍ර පිලට අයත් රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පළමුවන ලෝක මහා සංග්‍රාමය ඇති වීමට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) දෙවන ලෝක මහා සංග්‍රාමයේ ප්‍රතිඵල ලෙස ලෝක දේශපාලනයේ ඇති වූ වෙනස්කම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) ලෝක සාමය ආරක්ෂා කරගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

## 2022-23

9. (i) පළමුවන ලෝක සංග්‍රාමයට සම්බන්ධ වූ මධ්‍යම බලවතුන්ට අයත් රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත *A* සිට *D* දක්වා ප්‍රකාශවලට ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.

*A* - එක්සත් ජර්මනියක් නිර්මාණය කිරීමට පුරෝගාමී වූ නායකයා

*B* - පළමුවන ලෝක යුද සමයේ එංගලන්තයේ අගමැති

*C* - ඉතාලියේ පැසිස්ට් නායකයා

*D* - එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිෂේධ බලය හිමි රටකි

(ලොයිඩ් ජෝර්ජ්, වින්ස්ටන් චර්චිල්, බෙනිටෝ මුසෝලිනී, ඇඩොල්ෆ් හිට්ලර්, චීනය, ඉන්දියාව, ඔටෝ වොන් බිස්මාර්ක්, කයිසර් විලියම්) (ලකුණු 04 යි)

(iii) පළමුවන ලෝක යුද්ධයේ ප්‍රතිඵල **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) දෙවන ලෝක යුද්ධය ඇතිවීමට තුඩුදුන් හේතු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## 2016 – 2023 දක්වා රචනා ප්‍රශ්න පැමිණීමේ සාරාංශය

| මාතෘකාව | වර්ෂය හා ප්‍රශ්න අංක | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
| 1. ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රය | | | | 2 | 2 | | | 2 |
| 2. ශ්‍රී ලංකාව ජනාවාස වීම | 2 | 2 | 2 | 3 | 3 | 2 | 2 | 3 |
| 3. ශ්‍රී ලංකාවේ දේශපාලන බලය විකාශය වීම | 3 | 3 | | | | 3 | | |
| 4. ශ්‍රී ලංකාවේ පැරණි සමාජය | | 3 (IV) | | | | | 3 | |
| 5. ශ්‍රී ලංකාවේ පැරණි විද්‍යාව හා තාක්ෂණය | 4 | 4 | 3 | 4 | 4 | | | 4 |
| 6. ඓතිහාසික දැනුම හා එහි ප්‍රායෝගික... | | | | | | | | 5 |
| 7. නිරිතදිග නව රාජධානි | 5 | 5 | 4 | | 4 (VI) | | 4 | |
| 8. මහනුවර රාජධානිය | 6 | 6 | 6 | | 6 | 6 | 5 | 6 |
| 9. පුනරුදය | | | 8 | 8 | | | | |
| 10. ශ්‍රී ලංකාව හා බටහිර ලෝකය | | | | 5 | | | 4 | |
| | | | | | | | | |
| 1. කාර්මික විප්ලවය | | 8 | | 8 | 9 | 8 | | 9 |
| 2. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම | 7 | | 6 | 5 (IV) | 7 (I) | 6 | | |
| 3. ශ්‍රී ලංකාවේ ජාතික පුනරුදය | | | | | | | | |
| 4. බ්‍රිතාන්‍ය යටතේ දේශපාලන වෙනස්වීම | | 7 (I,II) | | | 7 (II,III) | | | |
| 5. බ්‍රිතාන්‍ය යටතේ සමාජ පරිවර්තනය | | 7 (III) | | 6 | 6 | | 6 | 7 |
| 6. ශ්‍රී ලංකාවට නිදහස ලැබීම | | 7 (IV) | 7 | 7 | 6 (IV,V)<br>7 (IV) | 7 | 7 | |
| 7. ලෝකයේ කැපීපෙනෙන විප්ලව | 8 | | 9 | | | | 8 | 8 |
| 8. ලෝක මහා සංග්‍රාම හා සම්මුතීන් | 9 | | 9 | | 9 | 9 | 9 | |